DOI: https://doi.org/10.4038/p.v14i1.26

*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 14-Iss. I, Jun. 2023, 40-53.*

# මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානයට පදනම් වූ භූගෝලීය සාධක

# [Geographical Defending Factors in Kandyan Kingdom in Military Organization]

**H.M. Isuru Herath[1]**

## Abstract

Geographical defending factors were very usefull to protect freedom in most nations in world history, such as Vietnam war, Cubain revelution war, Afganistan war and Kandiyan wars. Mainly Kandyan Kingdom is last monarch in Sri Lankan history. it was founded by the king Wimaladharmasuriya. Last king was king Sri Wichramarajasinha. Finally English conqured kandiyan kingodom in1814 AD. During this era Kandyan people fight to protect freedom against three European Warlilke nations, such as Portuguese, Dutch, and English. But kandiyan people used guerrilla war tactics against those nations. Speacily tropical climate, tropical jungles, rivers and mountain as a very useful for the defending Kandyan kingdom against those warlike European nations.

**Keywords:** Kandyan Kingdom, Sri Lankan History, Guerrilla War Tactics, Tropical Climate, Defenders

1 Assistance Laibarian, University of Peradeniya, Sri Lanka.

Received: 8 March 2023, Accepted revised version: 20 May 2023.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## හැඳින්වීම

පුරාතනයේ සිට වර්තමාන යුගය දක්වා වූ කාල සමය තුළ ලෝකයේ ප්‍රභවය වූ රාජධානි, අධිරාජ්‍යයන්, පෞර රාජ්‍යයන් සහ නූතන රාජ්‍යවල සැකසුණු ආරක්ෂක සංවිධාන කෙරෙහි ඒ ඒ දේශපාලන ප්‍රදේශවල පැතිරී පවතින භූගෝලීය සාධක පදනම් වී ඇත. ක්‍රි.පු. 58 දී ජූලියස් සීසර් ගෝල් දේශයේ (නූතන අංශය) ආක්‍රමණය කරන විට විශාල කඳු වැටි, ඝන වනාන්තර, ගංගා පදනම් කොටගත් ගෝල්වරුන්ගේ ඔප්පිඩියා (Oppidia) කඳුකර බලකොටු ආරක්ෂක සංවිධානයන් මහත් අභියෝගයක් විය. මේ නිසා වසර 10ක් පුරාවට ස්වකීය සේනා ක්‍රමානුකූලව පරිස්සම් සහගතව මෙහෙයවා බලකොටු 800ක් රජයූ ගෝල් ගෝත්‍ර 300ක් පමණ යටත් කිරීමට සීසර්ට සිදුවිය (Woodhead,1991:68). රුසියානු සමූහාණ්ඩුව හෙවත් සෝවියට් දේශයට එරෙහිව නාසි ජර්මනිය මෙහෙයවූ බාබර්රොස්සා මෙහෙයුමේදී (Operation Baberosa) බ්ලිට්ස්ක්‍රීග් නම් වූ හදිසි වේගවත් ප්‍රහාරක මෙහෙයුමේ සාර්ථක වීම පසුපස විශාල තැනිතලා, තෘණ භූමි, හේතු වුවද පසුව ශීත ඍතුව හා සබැඳි ආරක්ෂක සංවිධානයක් හරහා ප්‍රතිප්‍රහාර එල්ලකොට ක්‍රි.ව. 1944 දී සතුරා පරාජය කිරීමට රුසියන්වරුන්ට හැකිවිය (රාවෝ, 2013:335). මෙම සටනින් නාසි ජර්මන් සෙබළු දසලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් මිය ගියහ. ක්‍රි.ව. 1961 - 1975 පැවති වියට්නාම යුද්ධයේදී නිවර්තන වනාන්තර සහ කඳුකර භූමි කලාප හා සබැඳි ආරක්ෂක සංවිධානයක් හරහා ගරිල්ලා ප්‍රහාර එල්ලකොට ස්වකීය සතුරා වූ ඇමරිකාවට සෙබළ ජීවිත 58000ක් සහ ගුවන්යානා 400 අහිමි කිරීමට දේශානුරාගී වියට්නාමවරුන්ට හැකිවිය. අවසානයේ ලැජ්ජා සහගත පරාජයක් ලබා ගැනීමට ඇමරිකා එක්සත් ජනපදයට සිදුවිය.

මධ්‍යම කඳුකරයේ වන ලැහැබ්, ගිරි ශිඛර, සහ ගංගා ඇල දොළ වලින් සුරක්ෂිතවූ මහනුවර රාජධානිය ශ්‍රී ලාංකේය ඉතිහාසයේ අඳුරු යුගයක් නැතහොත් පරිහානි යුගයක් වශයෙන් හැඳින්වීමට ඇතැම් උගත්හු කැමැත්තක් දක්වති (දේවරාජ,1988:23). ඔවුන් එසේ හඳුන්වාදීමට කැමැත්තක් දක්වන්නේ පුරාතන රජරට ශිෂ්ටාචාරය හෙවත් ජලාශ්‍රිත ශිෂ්ටාචාරය (Hydraulic Civiliaization) සහ සංදේශ කාව්‍යවල උත්කර්ශවත් අන්දමින් වර්ණිත කොට්ටේ රාජධානි සමයත් සමග මහනුවර රාජධානිය සංසන්දනය කරමිනි. විශේෂයෙන්ම කීර්තිමත් රාජධානි පැවති කාලපරිච්ඡේදවල දේවානම්පියතිස්ස, දුටුගැමුණු, වළගම්බා, මහසෙන්, ධාතුසේන, හතරවන මිහිඳු, පළමු වන විජයබාහු, මහා පරාක්‍රමබාහු, කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල, හයවන පරාක්‍රමබාහු වැනි සිංහල රජවරු කරවූ ස්ථූප, ප්‍රතිමා ගෙවල්, පිරිත් මණ්ඩප, දළදා මාළිගා, වටදා ගෙවල්, උපෝසථාගාර, භික්ෂු රෝහල් වැනි, ආගමික ස්මාරක ද රජමාළිගා, රාජසභා මණ්ඩප, බලකොටු වැනි අනාගමික ස්මාරක සහ ඒවා තුළ අන්තර්ගත බිතුසිතුවම්, කැටයම්, මූර්ති මෙන්ම විශ්මයජනක මහා වැව්, මහා වාරිමාර්ග වැනි කැපීපෙනෙන ඉදිකිරීම් මහනුවර රාජධානිය අතින් ඉදිනොවීම උක්ත උගතුන් එසේ සංසන්දනය කිරීමෙහිලා උපස්ථම්භක වන්නට ඇත.

එහෙත් මහනුවර රාජධානිය වසර 2400 කට ආසන්න කාලයක් පැවති සිංහල රාජ්‍යත්වය දළදා වහන්සේ ප්‍රමුඛ ථේරවාදී බුද්ධ ශාසනය ආරක්ෂා කළහ. තව ද තමන්ට ආවේණික ගෘහ නිර්මාණ ශිල්පක්‍රම, උඩරට නර්තන කලාව, උඩරට චිත්‍ර සම්ප්‍රදාය, උඩරට කැටයම් කලාව, උඩරට පිත්තල, යකඩ ඇතුළු ලෝහ තාක්ෂණය, උඩරට ලාක්ෂා කර්මාන්තය, උඩරට ස්වදේශීය සංගීතය වැනි සංස්කෘතිකාංගයන් මෙන්ම සිංහල ශිෂ්ටාචාරයේ බුද්ධාගම කේන්ද්‍රකොටගත් විරාගත සමාජ හර පද්ධතීන් අන්තර්ගත සිංහල සමාජ ක්‍රමය ආරක්ෂා කළ මහනුවර රාජධානිය, සිංහලයන්ගේ ස්වාධීනත්වය රැකගත් අවසාන රාජධානිය බව අපි අමතක නොකරමු. එසේම ක්‍රි.ව. 1592-1815

දක්වා වසර 223 ක කාල පරිච්ඡේදය තුළ පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රිසි වැනි ත්‍රිවිධ යුරෝපියානු අධිරාජ්‍යයවාදී ආක්‍රමණයන් මෙන්ම ස්වදේශිය බලවතුන් වැනි සතුරන්ගේ කෝපාවිෂ්ට ප්‍රහාරයන්ට ලක්වීමට මහනුවර රාජධානියට සිදුවූ බව සඳහන් කළ යුතුය. විශේෂයෙන්ම ප්‍රයෝගකාරී දේශපාලන උපක්‍රම, ආගමික ප්‍රචාරණය, නවීන අවි බලයත් පදනම් කොට ගෙන ලතින් ඇමරිකාව, අප්‍රිකාව සහ ආසියා පැසිෆික් කලාපවල ජීවත්වූ සේමැන් (seman) සකායි (Sakai) බුෂ්මන් (Busman) නටිනීකා (Nutinica), ක්වාකේයුටල් (Kawakeutal) බෝරෝ (Boro), මසායි (Mazai), සුලු (Zulu), ඇබොර්ජිනිස් (Abiroginis), ඕෂානියා (Oceaniya), මඕරි (Maori) වැනි ස්වදේශීය පිරිස් යටත් කළ උක්ත ත්‍රිවිධ යුරෝපියානු අධිරාජ්‍යයවාදීහු ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ ද අඩු ආයාසයක් දරා යටපත් කිරීමට සමත් වූහ (Daryii,1934:11). ඒ ආකාරයට මහනුවර රාජධානිය ස්වකීය යටත් විජිත මාලයට එක්කර ගැනීම උත්සහ කළ ලොව ප්‍රථම යුරෝපියානු යටත් විජිතය වන්නේ පෘතුගීසින්ය. දහසය වන ශතවර්ශයේ මැද භාගයේ දී ඔවුන් බ්‍රසීලය, සියරාලියෝන්, ගිනියාව දකුණු අප්‍රිකාවේ සුභ පැත්මේ තුඩුව සහ ගෝව යනාදී වශයෙන් සමකාලීන ලෝකයේ විශාල භූමි ප්‍රදේශයක සහ මහා පරිමාණ ඇත් දළ, රන්, රිදී, වහල් වෙළෙඳ ජාලයක් කෘෘර ලෙස පවත්වාගෙන ගියහ. මැච්ලොක් (Matchlok) නම් තුවක්කු ද කැරවල් (Carval) නම් ගොඩබිමට ආසන්නව ගමන් කළ හැකි සැහැල්ලු යුධ නෞකා, කාලතුවක්කු සහිතව ගමන් කළ හැකි ගැලියෝන් (Galleon) වැනි තත්කාලීන ලෝකයේ හොඳම යුධෝපකරන පෘතුගීසින් සතුවිය (විමලරත්න, 2016:32). ඒවායේ පිහිටෙන් ලංකාවේ කෝට්ටේ රාජධානිය සහ යාපනය රාජධානිය යටත් කොටගත් ඔවුහු ජයග්‍රාහී ලීලාවෙන් මහනුවර රාජධානිය ක්‍රි.ව. 1594 සහ ක්‍රි.ව. 1602 ආක්‍රමණය කළ ද උඩරැටියන් අතින් පරාජයට පත්විය. මෙයින් කෝපයට පත් පෘතුගීසීහු උඩරැටියන්ගේ අභ්‍යන්තර සහ බාහිර වෙළෙඳාමට අවහිර කරමින් වර්ෂයකට දෙවරක් බැගින් මහනුවර රාජධානියට පහර දී කුඹුරු, වතුපිටි, විනාශකොට ධනධාන්‍ය කොල්ලකෑම, ගවයින් මස් පිණිස රැගෙනයාම, ස්ත්‍රීන් දූෂණය කිරීම, දරුවන් සහ පිරිමින් වදහිංසාකොට ඝාතනය කිරීම වැනි ම්ලේච්ඡ ක්‍රියා සිදු කළහ. මෙය වඩාත් තහවුරු වන්නේ කලක් ලක්දිව සේවය කොට ගෝවේ ප්‍රතිරාජයා වශයෙන් පත්ව ගිය දොන් ජෙරනිමෝ ද අසවේදු තමා ලංකාවේ කපිතාන් ජෙනරාල්වරයා වශයෙන් රාජකාරි කළ සමයේ මහනුවර රාජධානියට එරෙහිව අනුගමනය කළ යුද්ධ උපක්‍රම පිළිබඳ වූ සාඩම්බර ප්‍රකාශයකිනි. එහි මෙසේ දැක්වේ.

''...ඔවුන්ගේ ආහාර ද්‍රව්‍ය විනාශ කර දමමින් සහ ඔවුන්ගේ ගෙරි හරක් අප අල්වාගත් ප්‍රදේශවලට එළවා දමමින්, එම ප්‍රදේශවල වැසියන් අල්ලා ගනිමින් යුද්ධ ශක්තියම යොදා වසරකට දෙවරක්ම එයට පහර දෙමින් එම රාජධානියට විරුද්ධව මම නිරන්තර යුද්ධයක යෙදුනෙමි. එය සම්පූර්ණයෙන්ම ජන ශූන්‍ය වන තුරු, දා හතර හැවිරිදි වියෙන් ඔබ්බට එකම තරුණයෙකුවත් ජීවත්ව සිටීමට නොසලස්වන අයුරින් විනාශ කරමින්, මේ යුද්ධ කාලයේම එම රාජධානියෙහි ලේ ගලා යාමට සලස්වමින් මරණයට පත්කළ යුතුමය (දේවරාජ,1997:6)...''

මෙවැනි සාහසික යුධ උපක්‍රම හරහා මහනුවර රාජධානිය යටත් කිරීමට ගොස් පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරු තිදෙනකු පමණක් නොව සෙබළුන් දහසකට අධික සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත්වූ අතර වරෙක අසවේදුගේ ජීවිතය පවා ආරක්ෂා වූයේ අනූනමයෙනි. මීළඟට ලන්දේසින්ගේ වාරය පැමිණියේය. පෘතුගීසින් පළවා හැරීමේ පදනම මත උඩරට රජුන්ගේ ආරාධනාවෙන් දිවයිනට පැමිණි ලන්දේසීහු ක්‍රි.ව. දහහත් වන (17) ශත වර්ෂයේ මැද භාගය වන විට මුහුදු සිතියම්කරණය, දියුණු නාවික තාක්ෂණය

අතින් සමකාලීන යුරෝපියානු ජාතීන් අභිභවා සිටි අතර ඇම්ස්ටඩෑම් හි සිට නාගසාකි දක්වා දැවැන්ත වාණිජමය යුධමය කඳවුරු සහ ආරක්ෂිත කර්මාන්තශාලා පවා ඉහළ ලාභාංශ සහිතව පවත්වාගෙන ගියහ. ක්‍රි.ව. 1658 දී පෘතුගීසින් එළවා දැමීමෙන් පසුව මෙරට කුරුඳු, ගම්මිරිස් වැනි කුළුබඩු දෙස ස්වකීය ගිජු දෑස යොමුකළ ලන්දේසීහු ආර්ථික සම්බාධක, ඍජු ආක්‍රමණ හරහා මහනුවර රාජධානිය බෙලහීන කොට කුළු බඩු වෙළෙඳාම සියතට ගැනීමට වෑයම් කළ බව පෙනේ (විමලරත්න 2016:13).

ක්‍රි.ව. 1675 පමණ ලංකාවේ වෙරළබඩ කලාපයේ ආණ්ඩුකාරවර ෆන් හුන්ස් බතාවියානු (නූතන ජකර්තා) ලන්දේසි පෙරදිග පාලනාධිකාරයට දන්වා සිටියේ මහනුවර රජතුමාගේ ආධිපත්‍යය පුස්සක් බවත්, එනිසාම මහනුවර රාජධානිය අත්පත් කර ගැනීමට සුදුසු කාලය එළඹ තිබෙන බවයි. එහෙත් ඔහුගේ සැලැසුම උඩරැටියන්ගේ ප්‍රතිරෝධය හමුවේ මිථ්‍යාවක් පමණක් විය. ක්‍රි.ව. 1796 දී ලන්දේසීහු ලංකාවේ වෙරළබඩ කලාපයෙන් එළවා දැමීමට හිරු නොබසින අධිරාජ්‍යය නමින් විරුදාවලිය ලත් මහා බ්‍රිතාන්‍යයට හැකිවිය. විශේෂයෙන්ම ඕස්ට්‍රේලියාව වැනි මහද්වීපවල සිට නාවුරු (Nauru) වැනි කුඩා දූපත් ඇතුළු යටත් විජිත 54කින් සමන්විත මෙන්ම ශක්තිමත්, නවීන වෙඩි බෙහෙත් ආශ්‍රිත අවි ආයුධ, මනාව පුහුණු කළ පාබල සේනාංක සහ ප්‍රහාරක බලයෙන් අග තැන්පත් යුද්ධ නෞකාවලින් සමන්විත බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සමග පවා වසර 20 පුරාවට ඉමහත් දුෂ්කරතා මධ්‍යයේ නිර්භීතව මහනුවර රාජධානිවාසීහු සටන් කොට ස්වකීය නිදහස ආරක්ෂා කර ගත්හ. එය වඩාත් තහවුරු වන්නේ ක්‍රි.ව. 1803 පැති කීපයකින් මහනුවර රාජධානිය ආක්‍රමණය කළ මැක්ඩෝවල් - බාබුට් ක්‍රියාන්විතය අසාර්ථක වීමෙනි. යුද්ධ බලයෙන් උඩරැටියා පරාජය කිරීමට නොහැකි බව දැනගත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීහු ඩොයිලියානු ඔත්තු සේවා හරහා මහනුවර රාජධානිය සූක්ෂමව බෙලහීන කොට ක්‍රි.ව. 1815 පමණ යටත් කරගන්නා ලදි. යුරෝපියානු ආක්‍රමණ පමණක් නොව ක්‍රි.ව. 1664 අඹන්වෙලරාලගේ කැරැල්ල වැනි වරින්වර ඇති වුණු අභ්‍යන්තර අර්බුද මැඩ පැවැත්වීමට ද මහනුවර රාජධානියට සිදුවිය. දේශීය සහ විදේශීය වශයෙන් පැවති යුද්ධවලින් උඩරැටියා ජයග්‍රහණය ලැබීමට මූලධර්ම කීපයක් බලපා තිබේ. ඒවා පහත දැක්වෙයි. එනම්,

- මහනුවර රාජධානියට ලැබී තිබෙන ස්වාභාවික ආරක්ෂාව
- උඩරැටියන් සතුව පැවති උපායශීලී ගරිල්ලා යුද්ධ උපක්‍රම පිළිබඳ වූ දැනුම
- දීර්ඝ කාල පරිච්ඡේදයක් තුළ යුද්ධවලට මුහුණ දීමෙහි ලා උඩරැටියන් ලබා සිටි ශාරීරික සහ මානසික ශක්තිය
- ශ්‍රී දළදා වහන්සේ මත පදනම් වූ සිංහල බෞද්ධ සංස්කෘතිය මගින් සුරක්ෂිත කරන ලද ගිහි - පැවිදි අවියෝජනීය බැඳීම
- මහනුවර රාජධානියේ සරල එහෙත් උපායශීලි, ස්ථානෝචිත ආරක්ෂක සංවිධානයක් පැවතීම.

### පර්යේෂණ ගැටලුව

ත්‍රිවිධ යුරොපියානු ආක්‍රමණවලට සහ ස්වදේශීය කැරලිවලට මුහුණ දෙමින් රටවැසියා ආරක්ෂා කිරීමට මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානයට භූගෝලීය සාධක බලපෑවේ කෙසේ ද? යන්න සෙවීම මෙම පර්යෙෂණයේ ප්‍රධාන ගැටලුව වෙයි.

### පර්යේෂණ අරමුණු

1 භූගෝලීය සාධකවලට අනුගත වෙමින් මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානයේ ස්වරූපය පර්යේෂණාත්මක දෘෂ්ටිකෝණයෙන් විධිමත්ව හඳුනාගැනීම

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වෙයි.

2. භූගෝලීය සාධකවලට අනුගත වෙමින් දේශීය සහ විදේශීය සතුරන් මර්දනයට මහනුවර ආරක්ෂක සංවිධානය ක්‍රියාගත වූ ආකාරය පරීක්ෂා කිරීම මෙම පර්යේෂණයේ ද්විතියීක අරමුණ වෙයි.

**සාහිත්‍ය විමර්ශනය**

මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානය නම් වූ මෙම පර්යේෂණයේ දී එහි සංග්‍රාමික ඉතිහාසය, නිලබල ක්‍රමය, අවි ආයුධ, ගරිල්ලා යුධ උපක්‍රම, බලකොටු, බලඇණි වැනි ක්ෂේත්‍ර පිළිබඳව අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වෙයි. උක්ත විෂය ක්ෂේත්‍ර පිළිබඳව යම් යම් දෘෂ්ටිකෝණයෙන් දෙස් විදෙස් උගතුන් කීපදෙනෙකුම ද්විතීයික පර්යේෂණ වාර්තා සහ කෘති රචනා කොට තිබේ.

පොල් ඊ පීරිස් මහතා ක්‍රි.ව 1945 දී ප්‍රකාශයට පත් කළ Ceylon under Protugees era නම් වෙළුම් දෙකකින් යුත් කෘතියෙන් ක්‍රි.ව 1594-1638 දක්වා කාලසමය තුළ සිදුවූ මහනුවර පෘතුගීසි යුද්ධවල දී පෘතුගීසින් සහ උඩරැටියන් අනුගමනය කළ සුවිශේෂී යුද උපක්‍රම, තත්කාලයේ මහනුවර රාජධානියට එරෙහි ස්වදේශීය නැගිටීම්, උඩරට සේනා සංවිධානය, යනාදී මාතෘකා පිළිබඳව දත්ත ලබාගත හැක.

එසේම පී. ඊ. පී දැරණියගල මහතා විසින් රචිත Sinhala weapons and Armour නමින් රාජකීය ආසියාතික සමිතියේ 35 වෙළුමට ක්‍රි.ව 1942 පලකරන ලද ලිපියෙන් සහ ක්‍රි.ව 1964 රචිත සිංහල ත්‍රාසජනක ක්‍රීඩා නම් ලිපි ද්විත්වයෙන් මහනුවර රාජධානියේ අවි ආයුධ, අංගම්පොර ආශ්‍රිත යුද්ධ පුහුණුව සහ අවි ආයුධ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව සරල එහෙත් වැදගත් තොරතුරු සමුදායක් ඉදිරිපත් කොට තිබේ. එහෙත් මෙම ලේඛන තුනෙහිම භූගෝලීය තත්වයන් සහ බැඳුණ උඩරට ආරක්ෂක සංවිධානය පුළුල්ව සාකච්ඡා කොට නොමැත.

රැල්ෆ් පීරිස් මහතා ක්‍රි.ව 1964 දී රචනා කරන ලද සිංහල සමාජ සංවිධානය නම් කෘතියෙහි මහනුවර රාජධානියේ රජතුමා ප්‍රමුඛ යුද්ධ නිළධාරින් හා ඔවුන්ගේ කාර්යභාරය යුද්ධ සේනාවල ක්‍රියාකාරිත්වය සහ යුද්ධ සැපයුම් ක්‍රම සතුරන්ට එරෙහිව මහනුවර යුධ යාන්ත්‍රණය ක්‍රියාගත අනේකවිධ යුද උපක්‍රම සහ උඩරට සහ පෘතුගීසීහු එකිනෙකාට එරෙහිව ක්‍රියාත්මක කළ උල තැබීම, සමූල ඝාතනය කිරීමේ යුද උපක්‍රම හඳුනාගත හැකිය. මීට අමතර නවතම බලඇණි ඇති කිරීම හෝ ඒවා විසිරවීම වැනි තොරතුරු ලබාගත හැක. නිදසුන් ලෙස කුක්කන් මඩුවේ නිලධාරීන් අගනුවර ආරක්ෂක හමුදාවට මාරු කිරීම, තාවකාලික කඳවුරු, බලකොටු ඉදිකිරීම, මහනුවර හමුදාවේ යුධෝපකරණ සැපයීම, ආහාර සැපයීම වැනි ක්ෂේත්‍ර පිළිබඳව වටිනා තොරතුරු සැකෙවින් දක්වා ඇත. එහෙත් භූගෝලීය තත්වයන් උඩරට ආරක්ෂක සංවිධානය ගැන ශක්තිමත්ව සාකච්ඡා කොට නොමැත.

කපිතාන් එම්. එස්. සී. ද සිල්වා මහතා විසින් ක්‍රි.ව 1971 Spolia Zeylanica සඟරාවේ 32 වෙළුම 1 භාගයට සපයන ලද The Sinhala Army during Portugues Dutch and British Times නම් ලිපියෙහි මහනුවර රාජධානියේ හමුදා බළඇණි, උඩරට නාවික හමුදාව, රජු ප්‍රමුඛ හමුදා නිලධාරීන්, අවි ආයුධ, ගරිල්ලා යුධ උපක්‍රම පිළිබඳව සංක්ෂිප්ත තොරතුරු සමුදායක් ඉදිරිපත් කොට තිබේ. මෙහි ඇති අඩුපාඩුවක් වන්නේ උඩරට හමුදාවේ සේනාපතිවරයා වශයෙන් ගජනායක නම් නිලධාරිවරයා හඳුන්වා තිබීම ය. අනෙක මෙහි මහනුවර ආරක්ෂක සංවිධානය සම්බන්ධව කෙටි විස්තර සමුදායක් ඉදිරිපත් කොට තිබේ.

ටිකිරි අබයසිංහ ලෝනා දේවරජ සහ ජී. පී. වී. සෝමරත්න යනාදීහු ක්‍රි.ව. 1977 රචනා කරන ලද උඩරට රාජධානිය නම් කෘතියෙහි

මහනුවර රාජධානිය මුහුණ දුන් අභියෝග, පෘතුගීසින්ට ලන්දේසින්ට, ඉංග්‍රීසින්ට මෙන්ම සීතාවක රාජධානියට එරෙහිව පැවති සටන් සහ එහි දී උඩරට රාජධානියේ සේනා සංවිධානය, නිලබල ක්‍රමය, සහ සුළු වශයෙන් උඩරට යුද උපක්‍රම, උඩරට දේශසීමා පිළිබඳව සංක්ෂිප්ත තොරතුරු ලබාගත හැකිය. එහෙත් මෙහි මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානය පිළිබඳව ඇත්තේ අවම විස්තර සමුදායකි.

ක්‍රි.ව. 1978 ඉංග්‍රීසි ජාතික ජෙෆ්රි පවෙල් මහතා රචනා කරන ලද කන්ද උඩරට සටන් The Kandy war නැමැති කෘතියෙහි බ්‍රිතාන්‍ය-උඩරට සටන්, උඩරට යුද උපක්‍රම, මහනුවර ප්‍රාදේශීය ආරක්ෂක විධිවිධාන, උඩරට නිලබල ක්‍රමය පිළිබඳව සහ උඩරට ප්‍රහාර හමුවේ ඉංග්‍රීසින් මුහුණ දුන් ආකාරය, උඩරැටියන්ට එරෙහිව සටන්වලදී මැදරට භූගෝලීය තත්වයන්ට ඉංග්‍රීසින් මුහුණ දුන් ආකාරය සහ එකී අභියෝගවල දී බ්‍රිතාන්‍ය යුද්ධ යාන්ත්‍රනය ක්‍රීයාකාරී වූ ආකාරය යනා දී කරුණු සපයාගත හැක. මෙහි අනෙකුත් සතුරු පාර්ශ්වීයන් අතර පැවති සටන්වල දී උඩරට ආරක්ෂක සංවිධානය ක්‍රියාත්මක වූ ආකාරය විමසා බලා නොමැත. තවද භූගෝලීය සාධක මත පදනම් වූ උඩරට ආරක්ෂක සංවිධානය ගැන පුළුල්ව සාකච්ඡා කොට නොමැත.

ජයසේන ලියනගේ ක්‍රි.ව. 1992 රචනා කරන ලද පරංගි ආක්‍රමණ විරෝධය නැමති කෘතියෙහි උඩරට රාජධානිය සහ පෘතුගීසින් අතර පැන නැගුණු යුද්ධවලදී උඩරැටියන් භාවිතා කළ ගරිල්ලා යුධෝපක්‍රම සහ ජාතීන් ද්විත්වය අතර සටන් සහ ඒවාට බලපෑ හේතු හඳුනාගත හැක. එහෙත් මෙහි මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානය පිළිබඳව ඇත්තේ අවම විස්තර ප්‍රමාණයකි. අනෙක මෙහි පෘතුගීසින් හා මහනුවර රාජධානිය අතර සටන්වලට ප්‍රස්තුත වූ කරුණු පමණක් විමසා බලා තිබේ.

මීට අමතරව චන්න වික්‍රමසේකර විසින් ක්‍රි.ව. 1995 රචනා කරන ලද Kandy at war නම් කෘතියෙන් ත්‍රිවිධ යුරෝපියානු ආක්‍රමණිකයන්ට එරෙහිව උඩරැටියන් ක්‍රියා කල සටන් ව්‍යාපාර සහ ඒවායේ අනුගමනය කළ ගරිල්ලා යුද උපක්‍රම, දේශසීමා ආරක්ෂක විධික්‍රම, උඩරට හමුදා නිලබල ක්‍රමය සහ ඔවුන්ගේ වගකීම් අවි ආයුධ, අවි ආයුධ නිෂ්පාදන ක්‍රියාවලිය, බලකොටු ප්‍රමුඛ ප්‍රාදේශීය උඩරට ආරක්ෂක විධිවිධාන වැනි මාතෘකා පිළිබඳව තොරතුරු ලබා ගත හැක. එහෙත් භූගෝලීය සාධක මත පදනම් වූ උඩරට ආරක්ෂක සංවිධානය ගැන පුළුල්ව සාකච්ඡා කොට නොමැත.

ක්‍රි.ව 1997 දී ලෝනා දේවරාජ මහත්මිය රචිත උඩරට රාජධානිය නම් කෘතියෙහි මහනුවර ක්‍රි.ව. 1600-1782 කාලයේ මහනුවර රාජධානිය සහ ලන්දේසීන් අතර පැවති සටන්, විශේෂයෙන්ම ලන්දේසීන්ට එරෙහිව ක්‍රි.ව. 1762 ක්‍රියාකළ සටන් හා ඒවායේ දී උඩරැටියන් අනුගමනය කළ ගරිල්ලා යුද උපක්‍රම, මහනුවර රාජධානියේ රජුගේ යුධමය ක්‍රියාකාරකම් හමුදා නිලධාරීන් සහ ප්‍රාදේශීය ආරක්ෂක විධිවිධාන සහ දේශසීමා ආරක්ෂක තොරතුරු සම්බන්ධව දත්ත ලබාගත හැක. එහෙත් මෙහි අනෙකුත් සතුරු පාර්ශ්වයන් අතර පැවති සටන්වල දී උඩරට ආරක්ෂක සංවිධානය ක්‍රියාත්මක වූ ආකාරය විමසා බලා නොමැත. විශේෂයෙන්ම මෙම කෘතියේ මහනුවර රාජධානියේ භූගෝලීය සාධක මත පදනම් ආරක්ෂක සංවිධානය පිළිබඳව ඇත්තේ අවම විස්තර ප්‍රමාණයකි.

ක්‍රි.ව 1998 දී ජී. ඇස්. ගමගේ මහතා රචනා කරන ලද මහනුවර යුගයේ රාජ්‍ය ආරක්ෂක ක්‍රමෝපාය නම් කෘතියෙහි මහනුවර රාජධානියේ යුධ නිලධාරීන්, නීතිය හා අධිකරණ කටයුතු, මහනුවර සේනා සංවිධානය, අවි ආයුධ සන්නාහ ක්‍රම, ඔත්තු සේවය පිළිබඳ විස්තර අඩංගු වෙයි. තව ද උඩරට රාජධානිය අවට භූගෝලීය පිහිටීම සහ යුධෝපක්‍රම අතර

පවතින සම්බන්ධය, ගරිල්ලා යුධෝපක්‍රමවලට පදනම්වූ සන්නිවේදන කටයුතු පිළිබඳ ව තොරතුරු අඩංගුය. එහෙත් මෙහි ගරිල්ලා යුද උපක්‍රමයක් වශයෙන් හඳුන්වා දෙන්නේ සතුරාට සැඟව සිට පහරදීම පමණි. එහෙත් භූගෝලීය සාධක මත පදනම් වූ උඩරට ආරක්ෂක සංවිධානය ගැන තර්කානුකූලව සාකච්ඡා කොට නොමැත.

සී. ගැස්ටන් පෙරේරා මහතා විසින් ක්‍රි.ව. 2015 රචනා කරන ලද කන්ද උඩරටින් නැගුණු පෘතුගීසි විරෝධයඃ පෘතුගීසීන්ට එරෙහිව උඩරට සංග්‍රාම ඉතිහාසය නම් කෘතියෙහි මහනුවර රාජධානිය සහ පෘතුගීසින් අතර ඇතිවුණ සටන්, උඩරැටියන්ගේ යුධ උපක්‍රම, උඩරැටියන්ගේ අවි ආයුධ සහ සන්නාහ, යුද්ධ ඇඳුම් වැනි ලක්දිව පෘතුගීසි සේනා සංවිධානය සහ හමුදාවේ ව්‍යූහය ඇතුළු උඩරට සේනා සංවිධානය ගැන සරල වටිනා විස්තර සමුදායක් ඉදිරිපත් කොට තිබේ. එහෙත් මෙහි පෘතුගීසීන් හා මහනුවර රාජධානිය අතර සටන්වලට ප්‍රස්තුත වූ කරුණු පමණක් විමසා බලා තිබේ.

සමස්තයක් වශයෙන් පෙර සඳහන් කළ කිසිඳු පර්යේෂණයක භූගෝලීය සාධකවලට අනුව මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානය පිළිබඳව පුළුල් විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් මෙතෙක් සිදු වී නොමැත. භූගෝලීය සාධක හා බැඳුන මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානය පිළිබඳව නවතම තොරතුරු හෙළි කිරීමට මෙයින් උත්සාහ ගෙන තිබේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයට අවශ්‍ය දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික ක්‍රමවේදයක් වශයෙන් නිරීක්ෂණය උපයෝගී කර ගැනෙයි. මෙහිදී මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානය හා සෘජු සම්බන්ධයක් පවතින මහනුවර, බලන, හඟුරන්කෙත, ගන්නෝරුව හා ගලගෙදර යන ප්‍රදේශවල භූගෝලීය විෂමතා බලන බලකොටුව වැනි ස්ථාන පරීක්ෂාවට ලක් කෙරිණි. විශේෂයෙන්ම භූගෝලීය විෂමතා පරීක්ෂා කෙරෙන මෙම පර්යේෂණය සඳහා ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය අනුව ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය භාවිත වෙයි. මහාවංශය, රාජාවලිය, වන්නිරාජාවලිය, මන්දාරම්පුර පුවත, රොබට් නොක්ස්, ජෝන් ඩොයිලි, රිබෙයිරෝ, බැල්දියස්, ක්වේරොස්, ජෝන් ඩේවි, හෙන්රි මාෂල්, මේජර් ස්කිනර් යනාදින්ගේ තත්කාලීන වාර්තා යනාදී ප්‍රාථමික මූලාශ්‍රයවලට වැඩි අවධානය යොමු කෙරේ. තෙන්නකෝන් විමලානන්ද, පෝල් ඊ. පීරිස්, ටිකිරි අබේසිංහ, පී.ඊ.පී. දැරණියගල, ලෝනා ශ්‍රීමතී දේවරාජ, එච්.ඩබ්ලිව්. කොඩ්රිංටන්, පී.ඇස්. ගමගේ, රැල්ෆ් පීරිස්, එස්. අර්සරත්නම්, එච්. ඩබ්ලිව්. එච්. අබේවර්ධන, ජයසේන ලියනගේ, කොල්වින් ආර්.ඩී. සිල්වා, එච්. එම්. ඩී. ආර්. හේරත් යනාදී උගතුන් රචනා කරන ලද කෘති සහ පර්යේෂණ ලිපි ද්විතීයික මූලාශ්‍ර වශයෙන් මෙම පර්යේෂණය සඳහා යොදා ගැනේ. එලෙස රැස්කොට ගත් ප්‍රාථමික ද්විතීයික දත්ත මනාව සංවිධානය කර පසුව ඒවා විශ්ලේෂණය කොට නිගමනය කරා එළැඹීම මෙහි ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය වෙයි.

## පර්යේෂණයේ වැදගත්කම

ප්‍රස්තුත විෂය මාතෘකාව පිළිබඳව මීට පෙර විධිමත් පර්යේෂණයක් සිදුකොට නොමැත. උක්ත ඌනතාව පූරණය කිරීම මෙහි වැදගත්කම වෙයි. ප්‍රස්තුත විෂය මාතෘකාව පිළිබඳව ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය භාවිත කරමින් මෙම පර්යේෂණය සිදුකිරීම මෙහි ඇති අනෙක් වැදගත්කම වෙයි.

## සාකච්ඡාව

මහනුවර රාජධානියේ සුරක්ෂිතභාවය සහ උඩරැටියන් නිර්මාණය කළ ආරක්ෂිත සංවිධාන කටයුතු කෙරෙහි පැහැදිලිවම භූගෝලීය සාධක බලපා තිබේ. එතරම්ම

සරුසාර නොවූ තැනිතලාවක පිහිටි යාපනය රාජධානිය ක්‍රි.ව. 1620 සුළු අවධානමක් දරා පෘතුගීසීන්ට යටපත් කර ගැනීමට හැකිවූයේ එහි අල්ප වූ භූගෝලීය ලක්ෂණ හා සබැඳි උපායශීලී යුද්ධ සංවිධානයක් නොතිබූ බැවිනි. විශේෂයෙන්ම මහනුවර යුරෝපියානුවන්ගේ අක්‍රමණවල දී ඊට එරෙහිව ස්වකීය ආරක්ෂක සංවිධාන හරහා ප්‍රතිරෝධතා දැක්වීමේ දී උඩරට යුද්ධ විශේෂඥවරුන්ට මධ්‍යම කඳුකරයේ භූගෝලීය විවිධතා මහෝපකාරී වූ බව ජෙෆ්රි පවෙල්ගේ පහත දැක්වෙන ප්‍රකාශයෙන් ප්‍රකට වේ.

"... සිංහලයන් අවුරුදු බොහෝ ගණනක් තිස්සේ යුරෝපීය සතුරන් සමග විවෘත සටනක යෙදුනහ. එහෙත් ඝන වන ආවරණයෙන් යුත් කඳු පෙළත් කඳුකරයේ කටුක දේශගුණයත් තමන් සන්තකයේ ඇති හොඳ අවියක් බව ඔවුහු කල්යැමේදී තේරුම් ගත්හ. සිය දේශයේ ස්වාභාවික වාසියෙන් ප්‍රයෝජන ගන්නට ඉටා ගත් සිංහලයෝ පසු කාලයක ගරිල්ලා සටන් යනුවෙන් හැඳින්වුණු රණ තන්ත්‍රය ක්‍රියාත්මක කළහ....." (පවෙල්,2009:23).

ලංකා ඉතිහාසයේ අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා වූ දීර්ඝ කාලපරිච්ඡේදය තුළ මලය දේශය, මලය රට, මලය මණ්ඩලය, මහා මලය, මලයාණ්ඩුව, ගල්මල්රාම, කඳුරට, කන්ද උඩරට, පස්රට, උඩරට, යනාදී නම්වලින් හඳුන්වා ඇත්තේ මධ්‍යම කඳුකරය බව සාමාන්‍ය පිළිගැනීම ය. නිරපේක්ෂ පිහිටීමට අනුව උතුරු අක්ෂාංශ 60 - 80 - 450 සහ නැගෙනහිර දේශාංශ 800 - 80 - 810 -450 අතර පිහිටි, වර්ග ප්‍රමාණයෙන්ම සැතපුම් 12,360 පමණ සමන්විත වූ ද මුහුදු මට්ටමින් අඩි 1020 කට වඩා උසකින් පවතින්නා වූද, මධ්‍යම කඳුකරය මහනුවර රාජධානියේ හදවත වශයෙන් හඳුනාගත හැකිය. (දසනායක, 2005:1) විදේශ ආක්‍රමණ අභ්‍යන්තර ආරවුල් පැනනැගුණු අවස්ථාවලදී එකී සතුරු යුධකාමීන්ට ප්‍රතිරෝධය දැක්වීමට සහ පරාජය කිරීම සඳහා සිංහලයන්ට මධ්‍යම කඳුකරය ප්‍රයෝජනවත් විය. මීට අමතරව මධ්‍යම කඳුකරයෙහි මහනුවර රාජධානිය බිහිවීම කෙරෙහි බලපාන සාධක සෙවීමේදී ත්‍රිවිධ දුර්ග න්‍යාය වැදගත් වෙයි. නවතම පර්යේෂණවලට අනුව මෙම නාමාවලියට නිවර්තන දේශගුණය නම් භෞතික සාධකය ද එකතුකළ හැකිය. ඒ අනුව මහනුවර රාජධානියේ ආරක්ෂාව කෙරෙහි ගිරිදුර්ග, ජල දුර්ග, වන දුර්ග සහ නිවර්තන දේශගුණය යන සාධක බලපා ඇත.

### ගිරි දුර්ග

".... රජතුමාගේ කන්ද උඩරට රාජධානියට ස්වභාව ධර්මයාගේ පරිත්‍යාගය සම්බන්ධයෙන් විශිෂ්ට සාධකයකි. එය පර සතුරෙකුට ඇතුල්විය නොහැකි ලෙසත් පර්වත ප්‍රාකාර වලින් හාත්පසින්ම වටවුවා වැන්න..." (එදා හෙළදිව, 1992: 177).

මහනුවර රාජධානියේ ආරක්ෂාවට පදනම් වූ කඳු පන්ති, ශේෂ කඳු, නෙරු සානු යනාදී හූ ලක්ෂණ සියල්ල ගිරි දුර්ගවල වැදගත්කම රොබට් නොක්ස් දුටුවේ ඒ ආකාරයටය. උඩරටියන්ගේ බලකේන්ද්‍රය වන සෙංකඩගල පුරවරය ස්ථානගතව තිබුණේ මධ්‍යම කඳුකරයේ අඩි 1000 - 3000 උසැති මහනුවර සානුවේය. සානුව හරහා වක්‍රාකාරව ගමන් ගන්නා මහවැලි ගංගාව අගනුවරට උතුරින් නැගෙනහිරින් සහ බටහිරෙන් ස්වභාවික ආරක්ෂාව සපයයි. අඩි 3742 උසැති හන්තාන කඳුවැටිය අගනුවරට දකුණු දිශාවෙන් පිහිටා ඇත. අගනුවරට බටහිරෙන් ගන්නෝරුව, බෝලගල, කිරිමැටිය යනාදී තවත් කුඩා කඳු පෙළකි. මහනුවරට උතුරින් සැතපුම් 10 පළල පැතලි කඳු පෙළක් හඳුනාගත හැකිය. මුහුදු මට්ටමේ සිට අඩි 1640 ඉහළින් මහනුවර අගනගරය පිහිටා ඇත. මීට අමතරව උඩරට රජදරුවන්ගේ ආරක්ෂිත උපනගරයක් වන අඩි 2415 උසැති දිගිලිය පුරය හෙවත් හඟුරන්කෙත හඳුනාගත හැකිය. ඌව දෝණිය හෙවත් වැලිමඩ සානුව මහනුවර රාජධානිය

ගිණිකොණ දිශාවෙන් ආරක්ෂා කළ මහා පවුර විය. කිරිගල්පොත්ත කඳුවැටියේ සිට දළ වශයෙන් නමුණුකුල කඳුවැටිය දක්වා දිවෙන මෙහි සාමාන්‍ය උස අඩි 3000 - 4500 අතරය. (මද්දුමබණ්ඩාර,1984:19) නමුණුකුල කඳුවැටියට උතුරින් අඩි 3000 උසැති මඩොල්සිම - ලුණුගල කඳු පන්තිය හඳුනාගත හැකිය. තවද උසින් අඩි 3000 - 4000 කින් යුත් සමාන්තර කඳුවැටි සහ පටු ගැඹුරු නිම්න රැසකින් සමන්විත හැටන් සානුව දළ වශයෙන් සමනල කඳුවැටියේ සිට නාවලපිටිය දක්වා විහිදී ඇත. මහනුවර රාජධානිය නිරිත දිගින් ආරක්ෂා කළ ප්‍රධාන භූගෝලිය බලවේගය විය. මීට අමතරව තවදුරටත් මහනුවර රාජධානියේ නිරිත, බටහිර, වයඹ දිග සීමාවන් ආරක්ෂා කළ ප්‍රධානතම භූගෝලිය බලවේගය වූ උසින් අඩි 1000 - 3000 ක් වූ දොළොස්බාගේ කඳු පන්තිය ගම්පොල සිට අරනායක දක්වා විහිදී ඇත. නැගෙනහිර, ඊසාන දෙසින් මහනුවර රාජධානියේ ආරක්ෂා කල ස්වභාවික බාධකය වූයේ අඩි 1000 -3000 අතර උසින් යුත් දුම්බානාගල හෙවත් නකලස් (Knackles) කඳු පන්තියෙනි. දළ වශයෙන් මාදුගොඩ සිට නාලන්දාව දක්වා දළ බෑවුම් සහිතව මෙම කඳු පන්තිය විහිදී යයි. සෙංකඩගල නුවරට උතුරින් අඩි 1000 - 1500 අතර උසින් යුත් මාතලේ නාලන්දාව දක්වා මද බෑවුම් ලක්ෂණ සහිතව විහිදී යයි. නිම්නයේ දකුණු කලාපයේ අඩි 2000 වඩා උසින් යුත් කඳුවැටි කිහිපයකි. මහනුවර සානුවට දකුණු දිශාවෙන් අඩි 4000ට වඩා උච්චත්වයෙන් යුත් පිදුරුතලාගල මහා නිම්න බහුලය. පිදුරුතලාගල සිට වැලිමඩ දක්වා විහිදී යන අඩි 4000 - 6500 අතර උසින් යුත් උස් තැනිතලාය. High plains නම් වූ දීර්ඝ සානුවකින් යුක්තය. මෙම භූගොලීය පදනම් දෙකින්ම මහනුවර රාජධානියේ දකුණු දිග ප්‍රදේශ සුරක්ෂිත විය. උක්ත පීඩාකාරී භූගෝලීය මඟ හරිමින් සතුරන්ට මහනුවර රාජධානිය ආක්‍රමණය කිරීමට මහෝපකාරී වූ කපොලු හතරකි. ඒවා නම්,

බලන කපොල්ල - මහනුවර රාජධානියට බටහිරින් පිවිසිය හැකිය.

ගලගෙදර කපොල්ල - මහනුවර රාජධානියට වයඹින් පිවිසිය හැකිය.

බලකඩුව කපොල්ල - මහනුවර රාජධානියට උතුරින් පිවිසිය හැකිය.

ඉදල්ගස්හින්න කපොල්ල - මහනුවර රාජධානියට දකුණින් පිවිසිය හැකිය.

මෙම මර්මස්ථාන හරහා වුව ද උඩරට භූමියට පිවිසීමට සතුරන්ට අපහසු වූයේ ඝන වනාන්තර, කඳුවැටි, ගල් පර්වත, වගුරු බිම්, මෙන්ම අඩි 500 - 1000 අනුක්‍රමණ සහිත මොහොර, දළ සහ බිම් මෙන්ම ඇතුළත් මහනුවර සානුවට පිවිසීමේ හැකියාව ඉතා බැරෑරුම් නිසා බව පෙනෙයි. තව ද වර්ෂාපතනය හා බැඳුණු ඛාදනකාරකයන්ගේ ක්‍රියාවලි හේතුවෙන් කපොලු මාර්ග කුඩා වළවල් සහ ගල් බොරළුවලින් පිරී අබලන්ව පැවතිණ. මේ නිසා වෙරළබඩ තැනිතලාවේ සිට සැතපුම් 60 - 70 අතර පිහිටි මහනුවර රාජධානියට පා ගමනින් යන අක්‍රමණිකයන්ට මෙම කපොලු තරණය කිරීම අතිශය වෙහෙසකර සහ අවදානම් වන්නට ඇත. මීට අමතරව ලිස්සා යෑම්, ප්‍රපාතවලට පෙරලීම්, බඩු බාහිරාදිය ශාරීරය මතට කඩා වැටීම් වැනි හදිසි අනතුරුවලට මුහුණදෙමින් තනි පේළියට ගමන් ගන්නා ආක්‍රමණිකයන්ට ගමනාන්තයේදී ශාරිරිකව සහ මානසිකව දුර්වලවීම අනිවාර්ය සංසිද්ධියක් වුවාට සැක නැත. භූගෝලීය වශයෙන් ආක්‍රමණිකයන්ට මුහුණදීමට සිදුවන අපහසුතාවය ජේම්ස් කෝඩිනර් මෙසේ පෙන්වා දෙයි.

"..... ඔවුන්ගේ ගමන් මගේ තරණය කළ නොහැකි බාධක විය හැකි වූ ප්‍රපාතාකාර බෑවුම් තරණය කිරීම සඳහා සොල්දාදුවන්ට ඉනිමං රැගෙන යාමට සිදුවිය...." (A Description of ceylone,1983:417).

මෙපරිද්දෙන් ස්වකීය රාජධානියට පිවිසෙන

ආක්‍රමණිකයන් කල් තබා හඳුනාගැනීම සඳහා උඩරැටියන්ට කපොලු අවට උස් කඳු ප්‍රයෝජනවත් විය. ආක්‍රමණික සේනාවේ ස්වරූපය එලෙසින් හඳුනාගත්ත උඩරැටියන් ගස් ගල් පෙරලීම වැනි යුධ උපක්‍රම හරහා සතුරා පරාජය කිරීමට යුහුසුළු වූහ. තව ද කඳු පන්ති අතර ඇතැම් ස්ථානවල පිහිටා තිබෙන ගල් ගුහා කඳවුරු හෝ රෝහල් ලෙස පවත්වාගෙන යාමට මහන්සිගත් උඩරැටියන් ශ්‍රී දළඳ වහන්සේ සහ ස්වකීය රජතුමා සුරක්ෂිත කිරීම සඳහා දිගිලිය නුවර මැද මහනුවර නිල්ලඹේ නුවර යන කඳුකර ආරක්ෂක නිවස්න නිර්මාණය කළහ. මීට අමතරව දළඳ වහන්සේ ද සුදුසු තැනක සඟවා තැබිණ.

### වන දුර්ග

මහනුවර රාජධානිය අවට, විශේෂයෙන් දේශසිමා බද ප්‍රදේශවල කඳු, සානු, නිම්න, තැනිතලා, දුර්ග සහ කපොලු මාර්ග ආශ්‍රිතව පැවති ඝන වනාන්තර, මූකලාන් ලඳු කැලෑ සහ විශාල තෘණ භූමි යනාදී ස්වභාවික ලක්ෂණ සියල්ලම අතීතයේ වන දුර්ග නම් පොදු නාමයෙන් හැඳින්වූ බව සිතිය හැකිය. විශේෂයෙන්ම උක්ත වන ගහනයෙන් නික්මෙන ගුප්ත බියජනක ස්වභාවය රේවන්හාට්ගේ පහත දැක්වෙන විස්තරයෙන් පැහැදිලි වෙයි.

"..... ඉහල බලන ඔබට සෑම පැත්තකින්ම පෙනෙන්නේ අහස උසට නැගෙන කඳු සහ සතර දෙසින් ඇති අඳුරු වනාන්තරය ...." (රෙවන්හාට්, 1961: 417)

පැරණි මහනුවර රාජධානියට අයත් ප්‍රදේශ තෙත් කලාපයට සහ වියළි කලාපයට සීමා විය. එබැවින් වර්තමාන භූගෝලීය විද්‍යාත්මක කියවීම්වලට අනුව මෙහි වෘක්ෂලතා කලාප කීපයක් අනාවරණය කරගත හැකිය. එකී වර්ගීකරණයන් පහත දැක්වෙයි.

- කඳුකර සදාහරිත වනාන්තර - මධ්‍යම කඳුකරය නූතන මධ්‍යම පළාත අයත් ප්‍රදේශ
- වියළි සදාහරිත වනාන්තර - නුවර කලාපීය සහ තමන්කඩුව (නූතන උතුරු මැද පළාත ආශ්‍රිත භූමිය)
- තෙත් සදාහරිත වනාන්තර - මධ්‍යම කඳුකරයේ බටහිර නිරිතදිග බෑවුමේ සිට වෙරළබඩ කලාපය දක්වා වූ ප්‍රදේශය නූතන සබරගමුව පළාත
- පතන නම් තෘණ භූමි - තලාව ප්‍රදේශය (මද්දුමබණ්ඩාර,ඉ1984:22).

පොදුවේ මෙම තෙත් සහ වියළි කලාපීය වනාන්තර කුඹුක්, කොස්, කළුවර, පළු, වෑවරණ, නා, බුරුත, මිල්ල, හල්මිල්ල, වීර, බක් මී, පනක්කා, කොහොඹ, සියඹලා, මාදන් කිරිය, මූනමල්, ගොකටු, කිතුල්, පොල්, තල්, නුග, හුළං හික් වැනි වෘක්ෂවලින් පිරී පවතී. තව ද කඳුකර වනාන්තරවල ගස් අතු අතර වනස්ස, වැරැල්ල, බට මීවන නෙලු වැනි පාසි වර්ග සහ අක්මා ශාක වර්ගවලින් ගහණය, කඳු පන්ති අතර පහත් භූමි කලාප මානා, ඉලුක්, රඹුක් වැනි උස් තෘණ වර්ග සහ කටු පඳුරුවලින් ආවරණය වී ඇත. අධික වන ඝනත්වය නිසා දහවල් කාලයේදී පවා මෙම වනාන්තර තරමක් අඳුරු පැහැයගත් බව නිසැකය. මෙවැනි අධික ඝන වනාන්තර සමුදායකින් මහනුවර රාජධානිය මනාව සුරක්ෂිත විය. මහනුවර රාජධානියට එරෙහි යුරෝපියානුවන්ගේ මෙහෙයුම් අසාර්ථක වීමට ශාක ඝනත්වය පමණක් නොව උඩරට ප්‍රදේශවල ඉහළ ජෛව විවිධත්වය (Biodiversity) සහිත වනාන්තරවල වලසා, දිවියා, ගවයා, වල් ඌරා, වල් අලියා, වැනි සිවුපා විශේෂ ද පිඹුරා, පොළඟා, කරවලා, නාගයා, කුණකට්ටා වැනි උරග විශේෂ ද මදුරුවා, ගෝනුස්සා, කුඩැල්ලා, වැනි පරපෝෂිත සත්ව විශේෂ හේතු කොටගෙන ආක්‍රමණික සෙබළුන් විවිධ හදිසි අනතුරු සහ රෝගාබාධවලට ලක්වීමට සිදුවූ බවට සිතිය හැකිය. මදුරුවන් දෂ්ඨ කිරීම හේතුවෙන් යුරෝපියානු ආක්‍රමණිකයන් සමූහ වශයෙන්

කැලෑ උණ හෙවත් මැලේරියා රෝගය වැළඳී මිය ගියහ.

විශේෂයෙන්ම යුරෝපියානු ආක්‍රමණිකයන්ට මහත් උවදුරු ගෙන දුන් සත්ව විශේෂයක් ලෙස කූඩැල්ලා හඳුන්වා දිය හැකිය. උඩරට වනාන්තර ප්‍රදේශවල ජීවත් වූ කූඩැල්ලන් නිසා ස්වකීය සෙබලුන් විඳි දුක් ගැහැට පිළිබඳව රිබෙයිරෝ, බොකාරෝ, හෙන්රි මාර්ෂල්, ජෝන් ඩේවි, වැනි අපරදිග අයවලුන් වාර්තා තබා ඇත. පාවහන් නොමැතිව කූඩැල්ලන් ගහන ප්‍රදේශ හරහා ස්වකීය සෙබලු විඳි දුක් ගැහැට රිබෙයිරෝ නම් පෘතුගීසි නිළධාරියා මෙසේ වාර්තා කරයි.

"......අප මෙතෙක් සඳහන් කළ වල් සිවුපාවුන්ට අමතරව, මේ දිවයිනේ සිටින ඉතා හානිකර පිළිකුල් සහගත සතා නම් ලේ උණා බොන්නාය. (කූඩැල්ලා) වනාන්තරවල ඉතා අධික ලෙස සිටින මේ සතා මාර්ගවල ද බහුල වශයෙන් සිටියි. ශරීරයේ එල්ලෙන උන් එකෙකු ගලවා දැමූ විට තව දෙසීයක් පමණ ඇඟේ එල්ලෙන, අප ගමන් කරන බොහෝ අවස්ථාවලදී අපගේ දෙපා ලෙයින් තෙමී යයි. වැඩි වේදනාවක් දැනෙන්නේ පැටවුන්, ලේ උරන විටය. ලොකු කූඩැල්ලන් ඉඳිකටුවක පමණ දිගය. මහත හණ නූලක් මෙන්ය....." (රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය, 2002:141)

උඩරට රාජධානිය ආක්‍රමණය කිරීමේදී කූඩැල්ලන් නිසා පෘතුගිසීන් විඳි දුෂ්කරතා බොකාරෝ තවදුරටත් මෙසේ වාර්තා කරයි.

".... තදින් වැටුණු වැස්ස නිසා සොල්දාදුවන්ට විවේක ගැනීමට තැනක් නොවීය. වගුරුබිම් සහිත තණබිම් ජලය පිරී උතුරා ගියේ ය. එහි බොහෝ සේ කූඩැල්ලන් වූ බැවින් තුවාලවලින් රුධිරය වහනය වීම නිසා පසුදා උදෑසන වන විට සියලු දෙනාම තුවාල වූවන් මෙන් විය. (පෙරේරා,2015:10)

ත්‍රිවිධ යුරෝපියානු වාර්තාකරුවන් පෙන්වාදෙන පරිදි කූඩැල්ලන් දෂ්ට කළ විට වහාම කැසිල්ලක් ඇති වී පසුව එය අසාදනය වී අවයව පමණක් නොව ජීවිතය පවා විනාශ විය හැකිය. හෙන්රි මාර්ෂල්ට අනුව ක්‍රි.ව. 1818 උඩරට විමුක්ති ව්‍යාපාරය පරාජය කිරීමේදී යුද මෙහෙයුම්වලට සහභාගි වූ බ්‍රිතාන්‍ය සෙබලුන් 2073 දෙනෙකු මාස දෙකක් ඇතුළත කූඩැල්ලන් දෂ්ට කිරීම ආශ්‍රිත රෝගාබාධවලට ලක්ව රෝහල්ගත කර ඇත. විශේෂයෙන්ම මාෂල් පෙන්වාදෙන පරිදි සියලු බ්‍රිතාන්‍ය සෙබළුන්ගේ පාදවල වණ පැවති අතර එයින් වැඩි ප්‍රමාණයක් කූඩැල්ලන් දෂ්ට කළ ස්ථාන කැසීම නිසා අසාදනය වී දැවිල්ල සහ තුවාලවීම් අධික විය. දීර්ඝ ගමන්වල නිරත වීම නිසා තත්ත්වය වඩාත් දරුණු වූ අතර, පීඩාවට පත්වූවන් රෝහල් තුළට ඇතුළත් වන විට බොහෝ විට පණුවන් සහිත තුවාල පැවතින. (සිංහලේ,2004:35-36) මේ අනුව අපරදිග සතුරන්ගේ විජයග්‍රාහී සංග්‍රාමික මනස දුර්වල වූවාට සැක නැත. එකී අපහසුතාවය රිබෙයිරෝ මෙසේ වාර්තා කරයි.

"...... පාවහන් නොමැතිව කූඩැල්ලන්ගෙන් ගහන වැදුණ හා ගොහොරු බිම් අතරින් වැටුණු වනාන්තර තුළ තනි පෙළට ගමන් කිරීමට ඔවුන්ට සිදුවිය...." (රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය, 2002:14-41)

ආක්‍රමණිකයන් විඳි මෙම අපහසුතාවන් විපුල ප්‍රයෝජනය ගත් උඩරැටියන් සතුරු මාර්ග ආශ්‍රය කොටගත් විවිධ ගරිල්ලා ප්‍රහාර එල්ල කොට සතුරා ඉලක්කයට යාමට පෙර පරාජය කළහ. ඒ සඳහා උඩරැටියන් වනාන්තර අතර රහසිගත මාර්ග, උමං මාර්ග භාවිත කළහ. දීර්ඝ කාලයක් ගරිල්ලා යුද්ධවල නිරතවන සෙබළුන් දෛනිකව මුහුණදෙන ආහාරමය සහ වෛද්‍යමය ගැටලු වනාන්තර ආශ්‍රිත ශාකමය ආහාර වර්ග සහ ඔසු ශාක වර්ග මඟින් සපුරාගත හැකිවිය. මෙපරිද්දෙන් ස්වකීය ආරක්ෂක සංවිධාන කටයුතුවලට වැදගත් වූ වනාන්තර ආරක්ෂා කිරීමට කැලෑ කෝරාල නම් නිළධාරියෙකු ප්‍රමුඛ වනරක්ෂක නිළධාරිහු පිරිසක් පත්

කළ රජතුමා යුධෝපාය වශයෙන් වැදගත් කපොලු, කඩවත්, මාර්ග, නගර, ගම්මාන බලකොටු ආශ්‍රිත වනාන්තර කැපීම තහනම් කොට ඒවා වැසීයාමට ඉඩ හරින ලදි.

ස්වකීය රාජධානියේ පැවැත්ම කෙරෙහි බලපෑ ඇතැම් වනාන්තර දේවත්වයේලා සැලකීමට උඩරැටියෝ කටයුතු කළහ. නිදසුන් ලෙස සමනල කන්ද අවට වනාන්තර, සුමන සමන් දෙවියන්ගේ අඩවිය, කොත්මලේ උස්ගල් කන්ද, වනාන්තර දේවතා බණ්ඩාර දෙවියන්ගේ අඩවිය ලෙසත් හන්තාන කන්ද සහ බතලේගල කන්ද අවට ප්‍රදේශය ඉරුගල් බණ්ඩාර දෙවියන්ගේ අඩවිය ලෙස හඳුන්වන ලදි.

### ජල දුර්ග

මහනුවර රාජධානියේ ස්වාභාවික ආරක්ෂාවට මහෝපකාරී වූ ගංගා ඇළ දොළ කුඩා වැව් යනාදී ජල මූලාශ්‍රයයන් අතීතයේ ජල දුර්ග යනුවෙන් හැඳින්වූ බව සිතිය හැක. පුරාතන සහ නූතන ශ්‍රී ලාංකේය ජනතාවගේ කෘෂිකාර්මික, කාර්මික සහ දෛනික ජීවන කටයුතු මෙහෙයවන මහවැලි ගඟ, කැළණි ගඟ, කළු ගඟ, වළවේ ගඟ, කුඹුක්කන් ඔය යනාදී ජල මූලාශ්‍රය බොහෝමයක් ආරම්භ වන්නේ මධ්‍යම කඳුකරයෙනි. මුහුදු මට්ටමෙන් අඩි 4000ක් උසැති හැටන් සානුවෙන් ආරම්භ වන මහවැලි ගඟ මහනුවර සානුව හරහා චක්‍රාකාරව ගමන් කරමින් සෙංකඩගල නුවරට උතුරින්, නැගෙනහිරින් සහ බටහිර සීමාව ආරක්ෂා කළේ ය. (විතාරණ, 1984:30) පහත දැක්වෙන්නේ මහනුවර රාජධානියේ දේශසීමාවන් සුරක්ෂිත කළ ගංගා සහ ඔයවල් ය.

| | |
|---|---|
| මහවැලි ගංගාව<br>මාදුරු ඔය<br>ගල් ඔය | මහනුවර රාජධානියේ ඊසාන සහ නැගෙනහිර දේශ සීමාවන් සුරක්ෂිත කළේය |
| කුඹුක්කන් ඔය<br>මැණික් ගඟ<br>කිරිඳි ඔය<br>වලවේ ගඟ | මහනුවර රාජධානියේ දකුණු සහ ගිණිකොණදිග දේශ සිමාවන් සුරක්ෂිත කළේයි |
| කැලණි ගඟ<br>මහ ඔය<br>මී ඔය | මහනුවර රාජධානියේ බටහිර සහ වයඹදිග දේශ සිමාවන් සුරක්ෂිත කරන ලදී |
| කලා ඔය<br>මල්වතු ඔය<br>යාන් ඔය<br>මා ඔය | මහනුවර රාජධානියේ උතුරු සිමාව සුරක්ෂිත කළේය. |

මහනුවර රාජධානිය වෙත වැටී තිබූ පටු මාර්ග, නගර, බලකොටු ගම්මාන හරහා ගලා ගිය ගංගා හෝ ඇළ දොළවල පාලම් ඉදිකිරීම් සිදු වුයේ අල්ප වශයෙනි. ඊට විකල්ප වශයෙන් තොටුපල ආශ්‍රය කරගත් පාරු සේවයක් හෝ හදිසි අවස්ථාවල දී ඉවත් කළ හැකි අත්වැල් සහිත ඒ දඬු සවිකොට තිබිණි. ධාරානිපාත වර්ෂාපතනය හේතු කොටගෙන ගංගා සහ ඇළ දොළවල ජල මට්ටම ඉහළ ගොස් සියලු මාර්ග අවහිර වී සතුරු සේනා අනාරක්ෂිත මිටියාවත්වල කොටු වූ අවස්ථා පැවති අතර ජලයෙන් පෙඟී ගිය පොළොව රොන් මඩින් පිරී ගොස් සතුරු සහ ඔවුන්ගේ යුධෝපකරණ අපේක්ෂිත ඉලක්කයට රැගෙන යාම අපහසු වූ අවස්ථා එමටය. මීට අමතරව අධික ජල ගැලීම් හේතුවෙන් සතුරාගේ යුද්ධ උපකරණ ඉකුත් වී කඳවුරුවල වසංගත රෝග පැතිරි යාමේ අවදානමක් පැවති බව පෙනෙයි. මෙසේ දුෂ්කරතා විඳින සතුරාගේ සැපයුම් මාර්ග අවහිරකොට පසුව වටලා පහරදී සමූලඝාතනය හෝ ජීවග්‍රහයෙන් අල්ලා ගැනීමට අවස්ථාව උදාවිය.

### නිවර්තන දේශගුණය

රාත්‍රී කාලයේ ඝන මීදුම සහිත දිවා කාලයේ දැඩි උෂ්ණත්වයත් නිසා එකිනෙකට පරස්පර සේ වෙනස්වුණු දේශගුණය ද ප්‍රදේශය වටා පිහිටි කඳු අතර තෙරපුණු ගිණියම ද හේතුකොටගෙන ඔවුහු උග්‍ර ස්වසන ආබාධවලට ලක්වූහ. පාචනය සහ ආමාශගත ආබාධ නිතර ඔවුන් අතර පැතිර ගියේය. ගොදුරුවන කෙනෙකු මුහුදු සුළඟ වැදෙන ප්‍රදේශයකට වහාම රැගෙන යා හැකි නොවුණහොත් මාරාන්තික විය. කැළෑ උණ ද ඒ සමඟම ඔවුන් අතර පැතිර යන්නට විය. (පවෙල්, 2009:86)

ක්‍රි.ව. 1803 මැක්ඩෝවල් ආක්‍රමණය හරහා මහනුවර රාජධානිය අත්පත් කර ගැනීමට ගොස් ඉංග්‍රීසින් විඳි දුෂ්කරතා ජෝන් විලී නමැත්තා වාර්තා කළේ එලෙසය. ශ්‍රී ලංකාව නිවර්තන කලාපයට අයත් වන අතර වසරකට බොහෝ මාස රටට හිරු

රැස් සෘජුවම පතිත වෙයි. සූර්යයාගේ අධික බලපෑමට ලංකාව ලක්වීම යුරෝපයේ මෙන් සෘතු භේද නොමැති වන අතර උෂ්ණත්ව අන්තරය අල්ප වී සම දේශගුණයක් දිවයිනේ පැන නගියි. එබැවින් උණුසුම් දහවල් කාලය තුළ අධික සූර්යතාපයක්, රාත්‍රී කාලය තුළ අධික සිසිල් වීමක් සිදුවෙයි. මීට අමතරව ලංකා දේශගුණික වෙනස්වීම් කෙරෙහි දිවයින වටා පිහිටි මුහුදෙන් එන ගොඩ - මුහුදු සුළං බලපා තිබේ. (විතාරණ,1984:30) මෙනිසා ලංකාවේ ඕනෑම ස්ථානයකට වැසි පතිත වෙයි. සුළඟෙහි ආද්‍රතාවය හා සබැඳි තෙතමනය හේතුවෙන් අහස වළාකුළෙන් බහුල වන අතර සූර්ය තාපය වෙනස්වීම නිසා දහවල් සහ රාත්‍රී කාලයේ උෂ්ණත්ව අන්තරය අඩුවෙයි. ඩොල්ඩ්‍රන්ස් නම් අස්ථිර සුළං පවතින අඩු පීඩන කලාපයක ස්ථානගත වී පවතින ලංකාව දෙපස උප නිවර්තන ඉහළ වායු පීඩන කලාප පිහිටා ඇත. සූර්යතාපය හේතුවෙන් නිකුත්වන උද්වහන වායු ධාරා ආශ්‍රයෙන් ලංකාවේ වෙරළකරයේ සිට මධ්‍යම කඳුකරය දක්වා කවර ප්‍රදේශයක වුවද ගිගුරුම් සහිත වැසි ලැබෙයි. මධ්‍යම කඳුකරයට ද සාගරයේ වාසුළි අනුසාරයෙන් ද කුණාටු සහිත වැසි ලැබේ. මීට අමතරව උන්නතාංශය හේතුවෙන් මධ්‍යම කඳුකරයේ උෂ්ණත්වය ක්‍රමයෙන් අඩුවෙයි. (ගමගේ,1997:73)

උක්ත දේශගුණික තත්ත්වයන් හේතුවෙන් මධ්‍යධරණී සහ සෞම්‍ය දේශගුණයට හුරුව සිටින යුරෝපියානු ආක්‍රමණිකයන්ට විවිධාකාර රෝග ඇතිවිය. ඒ අතර පාචනය, මහාමාරිය, කොළරාව, මැලේරියාව වැනි වසංගත රෝග ද අමාශගත රෝග, පණු රෝග, චර්ම රෝග මෙන්ම ශ්වසනාබාධ වැනි රෝගාබාධ ප්‍රධාන තැනක් ගනී. මීට අමතරව ආහාර කල් ඉකුත්වීමෙන් පෝෂණ ගැටලු ද යුධෝපකරණ ඉකුත්වීමෙන් මානසිකව ආක්‍රමණිකයන් බිඳ වැටෙන්නට ඇත. නිවර්තන දේශගුණය කිසිසේත් නුසුදුසු යුරෝපියානු සෙබලුන්ගේ නිල ඇඳුම් අධික සූර්යතාපයට හෝ අධික ලෙස වර්ෂාපතනයට ලක්වීමෙන් ද ඔවුන් තවදුරටත් ශාරීරිකව හා මානසිකව දුර්වල වන්නට ඇත. කඳුකර දේශගුණයට ඔරොත්තු දීම සඳහා යුරෝපියානුවන් අරක්කු, බීර, වයින් වැනි මත්පැන් සහ අබිං වැනි මත්ද්‍රව්‍ය ද අධික ලෙස භාවිත කිරීමෙන් විනය පිරිහීම මෙන්ම ශාරීරික දුර්වලතා ඇති වුවාට ද සැක නැත.

## නිගමනය

මේ අනුව මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානයේ සාර්ථකත්වය කෙරෙහි වක්‍ර වශයෙන් භූගෝලීය කරුණු හේතු වූ බව පසක් වෙයි. පොදුවේ කරුණු කිහිපයක් මත පෙර විස්තර කරන ලද පරිදි, භූගෝලීය සාධක මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධානය ශක්තිමත් වීමට බලපෑ බව පහත දැක්වෙන පෙළගැස්මෙන් පැහැදිලි වෙයි. එනම්.

- මහනුවර රාජධානියේ දේශසීමා සහ අභ්‍යන්තර ප්‍රදේශවල ආරක්ෂාව පවත්වාගෙන යාමට රුකුලක් වීම.
- සතුරන්ට එරෙහිව උපක්‍රමශීලී ගරිල්ලා යුධ උපක්‍රම මෙහෙයවා පසුව පරාජය කොට උඩරට පාලක - පාලිතයන්ගේ ජීවිත ආරක්ෂා කිරීම.
- සතුරු ආක්‍රමණවලින් දළඳා වහන්සේ රජතුමා හා අනෙකුත් වැදගත් ප්‍රභූ කොටස් සුරක්ෂිත ස්ථානවලට ආරක්ෂිතව රැගෙන යාම.
- මහනුවර රාජධානිය ආක්‍රමණය කිරීමට පැමිණෙන සතුරා ශාරීරිකව සහ මානසිකව දුර්වල කිරීමට උඩරට භූගෝලීය සාධක හේතුවීම.
- කඳවුරු, මුරපොලවල්, අවි ආයුධ තැනීමට අවශ්‍ය වන දැව සහ ආහාර සහ වෛද්‍ය කටයුතුවලට අවශ්‍ය වන එළ වැල සහ ඖෂධ වැනි සැපයුම් වර්ග ලබා ගැනීමට අවශ්‍ය වන සම්පත් ලබා ගැනීම.

- ස්වකීය භූමිය ආක්‍රමණය කරන සතුරා ඔත්තු සේවා සහ පණිවුඩ හුවමාරු ක්‍රම හරහා හඳුනාගෙන ඊට උචිත පරිදි මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධාන කටයුතු සිදු කිරීම.

## මූලාශ්‍රය


රාවෝ, බි, වී. (2013). *ලෝක ඉතිහාසය.* බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

පවෙල්, ජෙෆ්රි. (2009). *කන්ද උඩරට සටන්* (පරි.). ප්‍රේමචන්ද්‍ර අල්විස්. කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

දසනායක කරුණාරත්න. (2005). *එදා උඩරට.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රොබට් නොක්ස්. (1992). *එදා හෙළදිව.* (පරි) ඩේවිඩ් කරුණාරත්න. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

මද්දුම බණ්ඩාර, සී.එම්. (1984). *මහවැලියේ ප්‍රභවය සහ භූගෝලීය පදනම.* මහවැලි වංශය. කාණ්ඩය සංස්. ඩී.ජී. ඒකනායක. කොළඹ: මහවැලි සංවර්ධන අමාත්‍යංශය.

රුසෙරු, ටි.කේ. (2002). *රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, ගැස්ටන්. (2015). *කන්ද උඩරටින් නැඟුණ පෘතුගීසී විරෝධය* (පරි.) ඩී. විසුම්පෙරුම. කොළඹ: විජිත යාපා ප්‍රකාශකයෝ.

හෙන්රි මාර්ෂල්. (2004). *සිංහලේ* (පරි.) එච්.ඇම්. සෝමරත්න. බොරලැස්ගමුව: විසිදුන ප්‍රකාශකයෝ.

විතාරණ විනී. (1984). *ගංගා මණ්ඩලය සහ ජල සම්පත්.* මහවැලි වංශය 1. කාණ්ඩය සංස්. ඩී.ජී. ඒකනායක. කොළඹ: මහවැලි සංවර්ධන අමාත්‍යංශය.

ගමගේ පී.ඇස්., (1997). *මහනුවර යුගයේ රාජ්‍ය ආරක්ෂක ක්‍රමෝපාය.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

දේවරාජ ලේනා. (1997). *උඩරට රාජධානිය.* කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

James Cordiner. (1983). *A description of ceylon*. Thisara publisears: Dehiwala.

Rewanhart, R. (1961). *The great road.* Royal saiatic society ceylon branch iv volume. Colombo.

Woodhead, Henry. (1991). *Empties ascendents (400 BC - AD 200)*. Amsterdam: Time life books.








උඩරට රාජධානිය
(ඡායාරූප මධ්‍යම පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙනි)

